විදුහල්පති,
ගා/සිරිධම්ම විද්‍යාලය,
ලබුදූව,
2022/09/01

..................................................... මයා/මිය

**ගණය :-** පාසලට ආසන්න පදිංචිය / ආදිශිෂ්‍ය / සහෝදර පදනම / අධ්‍යයන කාර්ය මණ්ඩල /රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරු / විදේශගත පදනම

කැඳවීම් අංකය :- ....................

## <u>2023 - පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබ විසින් මෙම විද්‍යාලයට ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රය පිළිබඳව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා 2022/....../........ දින පෙ.ව. ........... / ප.ව. ........... ට ඔබ විසින් ඉල්ලුම් කරන ලද ගණයට අදාළවන සහතිකවල මුල් පිටපත් හා ඡායා පිටපත් රැගෙන විද්‍යාලයේ ශ්‍රවණාගාරයට පැමිණෙන ලෙස දන්වමි.(අයදුම් පත්‍රය සමග ඡායා පිටපත් ඉදිරිපත් කර තිබේ නම් නැවත රැගෙන ඒම අවශ්‍ය නොවන බව සලකන්න.)

- ◆ **<u>සැලකිය යුතුයි</u>**

1. **සම්මුඛ පරීක්ෂණයට පෙර පවත්වනු ලබන පොදු උපදෙස් රැස්වීම 2022/09/20 දින පෙ.ව. 9.00 ට විද්‍යාලයීය ශ්‍රවනාගාරයේදී පැවැත්වේ. <u>විද්‍යාලයට ඇතුළුවීමේ අවසර පත්‍රය ලෙස මෙම ලිපිය හා ඔබගේ ජාතික හැඳුනුම්පත භාවිතා කරන ලෙස</u> කාරුණිකව දන්වමි. (පවතින කොරෝනා තත්ත්වය හේතුවෙන් නියමිත සෞඛ්‍යාරක්ෂිත උපදෙස් පිළිපදිමින් සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන්න.)**

2. දරුවා සමග අයදුම්කරු හෝ නීත්‍යානුකූල භාරකරු යන අයගෙන් එක් අයෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට සහභාගී විය යුතු අතර, පැමිණෙන විට පාසල් පරිශ්‍රයට සුදුසු ගැළපෙන ඇඳුමකින් සැරසී පැමිණීම අපේක්ෂා කරන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානයට පැමිණීමේදී ජංගම දුරකථන ක්‍රියා විරහිත කර රැඳී සිටින ලෙස කාරුණිකව දන්වමි.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබට වෙන් කරන ලද දිනය හා වේලාව වෙනස් කර ගැනීමට ඉල්ලීම් නොකරන ලෙස කාරුණිකව දන්වමි.

4. සම්මුඛ පරීක්ෂණයේදී අදාළ කරුණු සනාථ කිරීම සඳහා (චක්‍රලේඛනයට අනුව) සත්‍ය හා නිවැරදි ලිපිලේඛන පමණක් ඉදිරිපත් කළ යුතු අතර, ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිඳු ශීර්ෂයක් සඳහා ලකුණු ලබා නොදෙන බව සලකන්න.

5. සම්මුඛ පරීක්ෂණයට අදාළ වන කිසිඳු ලියවිල්ලක් සම්මුඛ පරීක්ෂණ දිනෙන් පසුව භාර නොගන්නා බව ද සලකන්න.

6. මෙම සම්මුඛ පරීක්ෂණ කටයුතු සාධාරණව ඉටුකළ යුතු බැවින් ඔබ බාහිර පුද්ගලයන් හා විවිධ සම්බන්ධතා යොදා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අනිසි බලපෑම් කිරීමෙන් වළකින ලෙස ද කාරුණිකව දන්වමි.

7. ඔබ ඉල්ලුම් කරන ලද ගණයට අදාළ වර්ණයෙන් පමණක් ඡායා පිටපත් ලිපිගොනු කවරය රැගෙන පැමිණිය යුතුය.

8. ඔබගේ නම / ලිපිනය / කැඳවීම් අංකය / ගණය සඳහන් කරන ලද රු. 110/- ක් වටිනා මුද්දර ඇලවූ ලිපි කවරයක් සහ ඔබගේ නම / ලිපිනය / කැඳවීම් අංකය / ගණය සඳහන් <u>නොකරන ලද</u> රු. 110/- ක් වටිනා මුද්දර ඇලවූ ලිපි කවරයක් සම්මුඛ පරීක්ෂණ දින රැගෙන පැමිණිය යුතුය.

9. ඔබ විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ඡායා පිටපත් තමන් විසින්ම සත්‍ය හා නිවැරදි බව සහතික කළ යුතු අතර, එම ලිපි ලේඛන පිළිවෙළට අංක කොට නාම ලේඛනයක් සේ සකසා දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.**(අයදුම් පත්‍රය සමග අදාළ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්නම් එහි සඳහන් ලේඛන පමණක් සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලැබේ.)**

10. ඔබ අයදුම්කරු ලෙස ඉදිරිපත් වන්නේ භාරකරු ලෙස නම් නීත්‍යානුකූල භාරකාරත්වය උසාවි නියෝගයන් මත ලබා ඇති බවට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

11. අයදුම්කරු පදිංචි ස්ථානය තහවුරු කිරීම සඳහා අක්ෂාංශ දේශාංශගත නිවසේ පිහිටීම (GPS) ආසන්න දශම ස්ථාන 04කට ලබාගෙන මෙ සමග එවනු ලබන ආකෘතිය, සාමදාන විනිශ්චය කාරවරයෙකු මගින් සහතික කර සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන පැමිණිය යුතුය.**(ආදිශිෂ්‍ය ගණයට අදාළ නොවේ.)**

12. ආදිශිෂ්‍ය ගණය යටතේ ආදිශිෂ්‍යා හෝ ශිෂ්‍යාව මියගොස් ඇත්නම්, අදාළ ලිපිලේඛන තහවුරු කරගෙන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීම සඳහා කලත්‍රයාට අවස්ථාව හිමිවේ.

13. ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන ව්‍යාජ ලිපි ලේඛන බවට සනාථ වුවහොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වන අතර, ඔබට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ඇත.

.............................

විදුහල්පති

## 1. <u>පාසලට ආසන්න පදිංචි කරුවන්ගේ දරුවන් – ලිපිගොනු කවර වර්ණය (කහ පාට)</u>

- ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචි වී ඇති වර්ෂ පිළිබඳ දිවුරුම් ප්‍රකාශය
- ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය
- පදිංචි ඉඩමේ හිමිකම් ඔප්පුව(අයදුම්කරුගේ/කලත්‍රයාගේ, මවගේ/පියාගේ නමට පදිංචි ඉඩමේ හිමිකම ඇත්නම් ඥාතීත්වය තහවුරු කිරීමට අදාළ උප්පැන්න සහතික ඉදිරිපත් කළ යුතුය.)
- කුලී නිවැසියෙකු නම් බදු ඔප්පුව (අයදුම්පත් භාගන්නා අවසාන දිනයේ සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.)
- ඉල්ලුම් කරන වර්ෂයට පෙර වර්ෂ 05 ක පත්ඉරු
- රජයේ නිල නිවාසවල පදිංචි නම් ලබාදීමේ ලිපිය හා වැටුප් විස්තර
- හිමිකම් ඔප්පුව නොමැති නම් පදිංචි ස්ථානය තහවුරු කිරීමට අයදුම්කරුගේ සහ කලත්‍රයාගේ උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, ජාතික හැඳුනුම්පත සහ පාසල් හැරයාමේ සහතිකය
- දරුවාගේ උප්පැන්න සහතිකය
- පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන (ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය/ ස්ථාවර දුරකථන බිල්පත(රැහැන් සහිත)/ පාසල් හැරයාමේ සහතිකය /විවාහ සහතිකය /ජීවිත රක්ෂණ හිමිකම් ඔප්පුව/ දරුවාගේ උප්පැන්න සහතිකය/බැංකු පොත/වාහන ලියාපදිංචි සහතිකය හෝ වාහන ආදායම් බලපත්‍රය හෝ වාහන රක්ෂණ සහතිකය **<u>(වසර 05 ට අදාළව)</u>**
- පාසලේ සිට ඔබේ නිවසට පැමිණීමේ මාර්ග සිතියම

**2. අදාළ පාසලේ ආදි ශිෂ්‍ය / ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන් - ලිපිගොනු කවර වර්ණය (දම් පාට)**

- ❖ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත
- ❖ දරුවාගේ උප්පැන්න සහතිකය
- ❖ විවාහ සහතිකය
- ❖ පාසල් හැරයාමේ සහතිකය (ශිෂ්‍ය කාර්ය දර්ශනය)
- ❖ අධ්‍යාපන සහතික (පාසල් කාලය තුළ)
- ❖ විෂය සමගාමී ජයග්‍රහණ පිළිබඳ සහතික හා අදාළ ලේඛන (පාසල් කාලය තුළ)
- ❖ පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහණ පිළිබඳ තොරතුරු
- ❖ පාසලේ දියුණුව සඳහා ලබාදුන් සහයෝග පිළිබඳ තොරතුරු
- ❖ ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය පිළිබඳ තොරතුරු

**3. දැනටමත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු / සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් ලිපිගොනු කවර වර්ණය - (රෝස පාට)**

- ❖ ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචි වී ඇති වර්ෂ පිළිබඳ දිවුරුම් ප්‍රකාශනය
- ❖ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය
- ❖ පදිංචි ඉඩමේ හිමිකම් ඔප්පුව
- ❖ කුලී නිවැසියෙකු නම් බදු ඔප්පුව(අයදුම්පත් භාගන්නා අවසාන දිනයේ සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.)
- ❖ ඉල්ලුම් කරන වර්ෂයට පෙර වර්ෂ 05 ක පත්ඉරු
- ❖ රජයේ නිල නිවාසවල පදිංචි නම් ලබාදීමේ ලිපිය හා වැටුප් විස්තර
- ❖ හිමිකම් ඔප්පුව නොමැති නම් පදිංචි ස්ථානය තහවුරු කිරීමට අයදුම්කරුගේ සහ කලත්‍රයාගේ උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, ජාතික හැඳුනුම්පත සහ පාසල් හැරයාමේ සහතිකය
- ❖ දරුවාගේ උප්පැන්න සහතිකය
- ❖ පාසලට පැමිණෙන වැඩිමහල් දරුවන්ගේ උප්පැන්න සහතික
- ❖ වැඩිමහල් දරුවන් පාසලේ ඉගෙනුම ලබන බවට සනාථ කරන ලිපි
(විද්‍යාලයෙන් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.)
- ❖ පාසලේ සිටින සහෝදර / සහෝදරියන් පාසලට ලබාදී ඇති ජයග්‍රහණ
(තොරතුරු සනාථ කිරීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය)
- ❖ දෙමාපියන් විසින් දැනට පාසලේ ඉගෙනුම ලබන තම දරුවන් වෙනුවෙන් ලබාදී ඇති විවිධාකාර සහයෝග පිළිබඳ (තොරතුරු සනාථ කිරීමට අදාළ ලිපි ඉදිරිපත් කළ යුතුය)
- ❖ පාසලේ සිට ඔබේ නිවසට පැමිණීමේ මාර්ග සිතියම

**4. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් ලිපිගොනු කවරය වර්ණය - (නිල් පාට)**

- ❖ දරුවාගේ උප්පැන්න සහතිකය
- ❖ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවා කාලය සනාථ කිරීමට පත්වීම් ලිපිය, ලොග් පිටපත හා වැඩ භාරගැනීමේ ලිපිය
- ❖ වර්ථමාන සේවා ස්ථානයෙන් ලබාගන්නා ලද සේවා සහතිකය
- ❖ දුෂ්කර සේවා කාලය සනාථ කිරීමට අදාළ ලිපි (කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කල)
- ❖ ඉල්ලුම්පත් භාරගන්නා වර්ෂයට පෙර වසර 05 ක ලබා නොගත් ඉතිරි නිවාඩු පිළිබඳ වාර්තාව (B 100- මගින්)
- ❖ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය
- ❖ පදිංචි ස්ථානයේ හිමිකම සනාථ කිරීමට අදාළ ලේඛන
- ❖ කුලී නිවැසියෙකු නම් බදු ඔප්පුව(අයදුම්පත් භාගන්නා අවසාන දිනයේ සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.)
- ❖ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත
- ❖ පාසලේ සිට ඔබේ නිවසට පැමිණීමේ මාර්ග සිතියම
- ❖ ගමන් දුර (වර්තමාන ස්ථිර පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර) නිගමනය කිරීම සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ලිපියකින් සනාථ කිරීම වඩා වැදගත්වේ.)

5. **<u>රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු නිලධාරීන්ගේ දරුවන් - ලිපිගොනු කවර වර්ණය ( කොළ පාට)</u>**

- ❖ ස්ථාන මාරු ලිපිය
- ❖ නව සේවා ස්ථානයේ වැඩ භාර ගන්නා ලද ලිපිය
- ❖ මුල් පත්වීම් ලිපිය
- ❖ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත
- ❖ විවාහ සහතිකය
- ❖ දරුවාගේ උප්පැන්න සහතිකය
- ❖ ඉල්ලුම්පත් භාරගන්නා වර්ෂයට පෙර වර්ෂ 05 ක ලබා නොගත් ඉතිරි කරගත් නිවාඩු පිළිබඳ වාර්තාව
- ❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති වර්ෂ පිළිබඳ දිවුරුම් ප්‍රකාශය
- ❖ පදිංචි ස්ථානයේ හිමිකම සනාථ කිරිමට අදාළ ලේඛන **(ස්ථාන මාරුවට පෙර හා පසු)**
- ❖ කුලී නිවැසියෙකු නම් බදු ඔප්පුව(අයදුම්පත් භාගන්නා අවසාන දිනයේ සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.)
- ❖ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය
- ❖ පාසලේ සිට ඔබේ නිවසට පැමිණීමේ මාර්ග සිතියම
- ❖ ගමන්දුර (පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර) නිගමනය කිරීම සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ලිපියකින් සනාථ කිරීම වඩා වැදගත්වේ.

6. **<u>ළමයා සමග විදේශගතව පදිංචි සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් - ලිපිගොනු කවර වර්ණය (සුදු පාට)</u>**

- ❖ ළමයා සමග විදේශගතව සිට පැමිණි බවට පිළිගත හැකි ලේඛන හා විදේශ ගතවූ ස්වභාවය සඳහන් ලිපි (විදේශ ගමන් බලපත්‍රය)
- ❖ ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති වර්ෂ පිළිබඳ දිවුරුම් ප්‍රකාශය
- ❖ දරුවාගේ උප්පැන්න සහතිකය
- ❖ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හා ජාතික හැඳුනුම්පත
- ❖ විවාහ සහතිකය
- ❖ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය
- ❖ පදිංචි ස්ථානයේ හිමිකම සනාථ කිරීමට අදාළ ලේඛන
- ❖ කුලී නිවැසියෙකු නම් බදු ඔප්පුව(අයදුම්පත් භාගන්නා අවසාන දිනයේ සිට ඉදිරියට වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතුය.)
- ❖ පාසලේ සිට ඔබේ නිවසට පැමිණීමේ මාර්ග සිතියම